# ශ්‍රී ලාංකේය සංස්කෘතියේ විද්‍යමාන

# කාලි සංකල්පය

කළු බණ්ඩාරගේ දීපාල් ගුණසේන

දර්ශනසූරි 2018

# ශ්‍රී ලාංකේය සංස්කෘතියේ විද්‍යමාන

# කාලි සංකල්පය

කළු බණ්ඩාරගේ දීපාල් ගුණසේන

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනසූරි උපාධි පරීක්ෂණය සඳහා

සංස්කෘතික අධ්‍යයනය විෂය යටතේ ඉදිරිපත් කරන

පර්යේෂණ නිබන්ධය.

2018

# පිදුම

**විදුදය මැණියන්ට බැති සිතින් පුදමි....**

**පර්යේෂක ප්‍රකාශය**

මේ නිබන්ධයට ඇතුළත් කර ඇති ''ශ්‍රී ලාංකේය සංස්කෘතියේ විද්‍යමාන කාලි සංකල්පය'' නම් වූ පර්යේෂණ කාර්යය උපදේශකවරයාගේ උපදේශකත්වය යටතේ සිදු කළ බවත්, වාචික පරීක්ෂණයේ දී පරීක්ෂක මණ්ඩලය විසින් ලබා දුන් සංශෝධන සහිත ව ඉදිරිපත් කරන බවත්, මෙම පර්යේෂණයට අදාළව පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් හෝ කිසිදු වාර්තාවක් වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා කිසිදු විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යයන ආයතනයකට හෝ ඉදිරිපත් කර නොමැති බවත් මෙයින් සහතික කර ප්‍රකාශ කර සිටිමි.

....................................................    ....................................................

කේ.බී. දීපාල් ගුණසේන    දිනය

## උපදේශකවරයාගේ සහතිකය

කේ. බී. දීපාල් ගුණසේන (1302HU2013002) නම් වන දර්ශනපූරී උපාධි අපේක්ෂකයා විසින් කරනු ලැබ ඇති ප්‍රකාශය සත්‍ය බවත්, මාගේ උපදේශකත්වය යටතේ සිදු කළ මෙම පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් වාචික පරීක්‍ෂණයේ දී පරීක්‍ෂක මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද සියලු සංශෝධන සහිත ව නිබන්ධය සකසා ඇති බවත් සහතික කරමි.

ආචාර්ය ඩබ්. බී. ඒ. විතාරණ

දිනය :- .......................................................

# පටුන

පිටු අංකය


පටුන i

වගු සහ සිතියම් පටුන vii

ඡායාරූප නාමාවලිය viii

උපකාරානුස්මෘතිය xiii

සංක්ෂිප්තය xiv

1 පරිච්ඡේදය

හැඳින්වීම

1.1 මාතෘකාව හැඳින්වීම 1

1.2 අධ්‍යයන ගැටලුව සහ උපකල්පනය 8

1.3 අධ්‍යයන අරමුණු 9

1.4 අධ්‍යයනයේ වැදගත්කම 10

1.5 පරිච්ඡේදකරණය 12

2 පරිච්ඡේදය

සාහිත්‍ය සමීක්ෂාව

2.1 හින්දු ආගම සහ එහි කාලි සංකල්පය පිළිබඳ ලියැවී ඇති ග්‍රන්ථ 17

2.2 හින්දු ආගම හා එහි දේව සංකල්පය පිළිබඳ ලියැවී ඇති ග්‍රන්ථ 19

2.3 ලක්දිව හින්දු සංස්කෘතිය පිළිබඳ ව ලියැවී ඇති ග්‍රන්ථ 32

2.4 ලක්දිව දේව සහ යක්ෂ සංකල්පයේ ආරම්භය සහ විකාශය පිළිබඳ ලියැවී ඇති ග්‍රන්ථ 44

2.5 ලක්දිව ප්‍රචලිත දේව සංකල්ප පිළිබඳ ලියැවී ඇති ග්‍රන්ථ 45

2.6 ලක්දිව ප්‍රචලිත ඇදහිලි විශ්වාස පිළිබඳ රචිත ග්‍රන්ථ 52

2.7 කාලි සංකල්පය හා බැඳුණු දේශීය සංස්කෘතිකාංග පිළිබඳ විස්තර ඇතුළත් වන ග්‍රන්ථ 61

3 පරිච්ඡේදය

පර්යේෂණ ක්‍රමවේදය


3.1 පර්යේෂණ ප්‍රවේශය 65

3.2 පර්යේෂණ ක්‍රමය 66

3.3 පර්යේෂණ අරමුණු 67

3.4 අධ්‍යයන ජනගහනය 68

3.5 නියැදිය 69

3.5.1 නියැදි ක්‍රමය 70

3.6 දත්ත රැස් කිරීමේ ක්‍රමවේද

3.6.1 ලේඛන හැදෑරීම් 71

3.6.2 ක්ෂේත්‍ර අධ්‍යයනය 72

3.6.3 සම්මුඛ සාකච්ඡා 74

3.6.4 නිරීක්ෂණය 75

3.7 පර්යේෂණ සීමා 76

3.8 ආචාර ධර්ම 78


4 පරිච්ඡේදය

දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය


4.1 හින්දු සමය සහ කාලි සංකල්පය

4.1.1 හින්දු සමයෙහි විකාශය 79

4.1.2 වෛදික ඇදහීම් 81

4.1.3 හින්දු සමය 82

4.1.4 ශාක්ත වන්දනය 86

4.1.5 කාලි දෙවඟන 94

4.1.6 කාලි දෙවඟනගේ භෞතික ස්වරූපය 101

4.1.7 කාලි දෙවඟන අත දරන ආයුධ සහ සංකේත 103

4.1.8 කාලි දෙවඟනගේ ස්වරූප සහ නාම 107

4.2 ශ්‍රී ලාංකේය කාලි සංකල්පය

4.2.1 ශ්‍රී ලාංකේය කාලි සංකල්පයේ ඓතිහාසික පසුබිම 114

4.2.2 ශ්‍රී ලාංකේය කාලි සංකල්පයේ අද්‍යතන ස්වරූපය, භාවිතය 133

4.2.2.1 භද්‍රකාලි 133

4.2.2.2 සොහොන් කාලිය 134

4.2.2.3 වදුරු කාලි 135

4.2.2.4 ලේ කාලි 136

4.2.2.5 බහිරව කාලි 136

4.2.2.6 අග්නි කාලි (ගිනිකාලි) 137

4.2.2.7 යම කාලි 137

4.2.2.8 ශාන්ත කාලි 137

4.2.2.9 රාජකාලි 137

4.2.2.10 අඝෝර කාලි 138

4.2.2.11 පත්‍රකාලි 138

4.2.3 කාලි යක්ෂිණිය 142

4.3 කාලි කෝවිල්

4.3.1 ලංකාවේ කාලි කෝවිල් 147

4.3.1.1 උතුරු පළාත - යාපනය වීරමහාකාලි අම්මන් කෝවිල 149

4.3.1.2 වයඹ පළාත - හලාවත මුන්නේශ්වරම් භද්‍රකාලි කෝවිල 153

4.3.1.3 නැඟෙනහිර පළාත - ත්‍රිකුණාමලය භද්‍රකාලි අම්මන් කෝවිල 156

4.3.1.4 බස්නාහිර පළාත - මෝදර කාලි කෝවිල 160

4.3.1.5 ඌව පළාත - බදුල්ල රොක්හිල් කාලි කෝවිල 162

4.3.1.6 මධ්‍යම පළාත - මාතලේ ඒලුමුග කාලි අම්මන් කෝවිල 164

4.3.1.7 සබරගමු පළාත - රත්නපුර ශ්‍රී භද්‍රකාලි කෝවිල 167

4.3.2 කාලි කෝවිල්හි පැවැත්වෙන පූජා චාරිත්‍ර සහ උත්සව

4.3.2.1 පූජා චාරිත්‍ර 170

4.3.2.2 උත්සව 176

4.3.3 කාලි කෝවිල්හි සිදුකෙරෙන විනකර්ම 179

4.4 ශ්‍රී ලාංකේය සංස්කෘතිකාංග කලා නිර්මාණ හා බැඳි කාලි සංකල්පය

4.4.1 සංස්කෘතිකාංග හා කලා නිර්මාණ 183

4.4.1.1 යාතු කර්ම 184

4.4.1.2 කඩවර යක් කංකාරිය 187

4.4.1.3 පිදේනි ශාන්තිකර්මය 190

4.4.1.4 බලි ශාන්තිකර්මය 191

4.4.1.5 රටයකුම 193

4.4.1.6 සූනියම් යාගය 194

4.4.1.7 හත්අඩියේ දෙහි කැපීම 198

4.4.1.8 බහිරව පූජා 200

4.4.1.9 ෂඩංග පූජා 202

4.4.1.10 පන්දම් දොළහ දීම 202

4.4.1.11 වඳුරු ශාන්තිය 203

4.4.2 සුළු ශාන්තිකර්ම 204

4.4.2.1 කළුකුමාර දෑහැන 205

4.4.2.2 සක්කර දානය 205

4.4.2.3 විත කැපුම 206

4.4.2.4 යක්ෂ බන්ධන කැපීම 206

4.4.3 දේව කන්නලව්, දේවාරාධනා කවි 207

4.4.3.1 මහා භද්‍රකාලි මෑණියන්ට කරන කන්නලව්ව 207

4.4.3.2 භද්‍රකාලි කන්නලව්ව 207

4.4.3.3 සොහොන් කාලි කන්නලව්ව 208

4.4.3.4 පත්‍රකාලි දෙවියන්ගේ කෝල්මුර කවි 209

4.4.4 ගැමි නාටක

4.4.4.1 කෝලම් නාටකය 211

4.4.4.2 සොකරි නාටකය 213

4.4.5 ශ්‍රී ලාංකේය නර්තන කලාවෙහි නිරූපිත කාලි 214

4.4.6 දේශීය නිර්මාණ අංගයන්හි නිරූපිත කාලි 216

4.4.6.1 කාව්‍ය සාහිත්‍ය 216

4.4.6.2 ගීත සාහිත්‍ය 223

4.4.6.3 දේශීය සිනමාව සහ ටෙලිනාට්‍ය 225

4.5 සමාජීය විශ්වාස හා ආකල්ප

4.5.1 සිංහල බෞද්ධ සමාජීය විශ්වාස හා ආකල්ප 227

4.5.1.1 ශ්‍රී මහා භද්‍රකාලි පූජාව 235

4.5.1.2 ආවේශය, ආවේශයෙන් ශාස්ත්‍ර කීම 235

4.5.1.3 කාලි වරම ලබා ගැනීම 236

4.5.2 යන්ත්‍ර මන්ත්‍ර 237

4.5.2.1 මහා කාලි දිෂ්ටිය 239

4.5.2.2 භද්‍රකාලි යන්ත්‍රය 239

4.5.2.3 මහා කාලි ධ්‍යාන යන්ත්‍ර 240

4.5.2.4 කාලි දෑහැන් හත 241

4.5.2.5 මහා කාලි සිද්ධි සාධකය 242

4.5.2.6 කාලි ගිනි පේසු මාලා බන්ධන 243

4.5.2.7 කාලි මන්ත්‍ර 243

4.5.3 නාශනකර්ම 244

4.5.3.1 සතුරු නාශක භද්‍රකාලි කවචය 245

4.5.3.2 අනියම් ඇසුර නවතා දමන ගුරුකම් 246

4.5.3.3 අංජනම් සහ වශී බන්ධන 248

4.5.3.3.1 වශී බන්ධන 248

4.5.4 ද්‍රවිඩ හින්දු සමාජීය විශ්වාස හා ආකල්ප 252

4.5.4.1 වතුකර ද්‍රවිඩ ජන සමාජගත කාලි වන්දනය 258

4.5.4.2 කාලි මන්ත්‍ර 262

4.5.5 කාලි සංකල්පය හා බැඳි සමාජ මනෝ විද්‍යාත්මක පසුබිම 264

5 පරිච්ඡේදය

සමාලෝචනය 276

ආශ්‍රිත ග්‍රන්ථ 283

උපග්‍රන්ථ

ඡායාරූපාවලිය

## වගු පටුන

පිටු අංකය


| | | |
|---|---|---|
| i | වගුව - අධ්‍යයන ජනගහනය හා නියැදිය | 69 |
| ii | වගුව - කාලි කෝවිල් සහ දේවාලයන්හි පූජකවරු, බාර නිලධාරීහු බැතිමත්තු | 69 |
| iii | වගුව - සම්මුඛ සාකච්ඡා සඳහා යොදාගත් නියැදිය | 74 |
| iv | වගුව - නිරීක්ෂණය කරන ලද කෝවිල් සංඛ්‍යාව | 76 |


## සිතියම්


i සිතියම - පෞරාණික කාලි කෝවිල්

ii සිතියම - කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි කාලි කෝවිල්

iii සිතියම - වතුකරයේ කාලි කෝවිල්

iv සිතියම - සිංහල කපු මහත්වරුන්, කපු මැණිවරුන් පවත්වාගෙන යන කාලි දේවාල

v සිතියම - වෙනත් හින්දු කෝවිල්

## ඡායාරූප නාමාවලිය

**ඡායාරූපය**

i. කාමාඛ්‍යා දෙවොලේ පුදනු ලබන ශක්තියගේ යෝනිය

ii. කාලි දෙවඟනගේ භෞතික ස්වරූපය

iii. කාලිය අත දරණ ආයුධ සහ සංකේත

1. කඩුව
2. පලිහ
3. චක්‍රය
4. කට්වංගය
5. ත්‍රිෂූලය
6. දුන්න, ඊතලය
7. ගදායුධය
8. සංඛය
9. මිනීහිස
10. ලේ පිරුණු බඳුන

iv. මහාකාලි

v. දක්ෂිණ කාලි

vi. වාමකාලි

vii. භද්‍රකාලි

viii. සම්ශනකාලි

ix. ශ්‍යාමකාලි

x. සිද්ධිකාලි

xi. රාක්ෂකාලි

xii. මාතාංගිකාලි

xiii. බගලා කාලි

xiv. භෛරවී

xv. තාරා

xvi. ළදරුවෙකුගේ ස්වරූපයෙන් යුතු ශිවට කිරිපොවන කාලිය

xvii. පොළොන්නරු කාලි කෝවිල් නටඹුන්

xviii. යාපනය වීරමහා කාලි අම්මන් කෝවිල

xix. බෙන්තොට ගලපාත විහාරයේ ඇති බෙන්තොට කාලි කෝවිලෙහි ගල් උළුවස්ස

xx. සීතාවක බැරැන්ඩි කෝවිල

xxi. භද්‍රකාලි මූර්තිය

xxii. සොහොන් කාලි මූර්ති

xxiii. ශාන්ත කාලි මූර්තිය

xxiv. රාජ කාලි මූර්තිය

xxv. කාලි යක්‍ෂණිය

xxvi. කෝවිල් මුලාකෘතිය

xxvii. යාපනය වීරමහා කාලි අම්මන් කෝවිලෙහි කාලිදෙවඟනගේ මූලමූර්තිය

xxviii. යාපනය වීරමහා කාලි අම්මන් කෝවිලෙහි අභ්‍යන්තර ස්වරූපය

xxix. යාපනය වීරමහා කාලි අම්මන් කෝවිලෙහි පඬුරු ගැටගසන කෝන්ගස

xxx. හලාවත මුන්නේශ්වරම් භද්‍රකාලි අම්මන් කෝවිලෙහි කාලිදෙවඟනගේ මූලමූර්තිය

xxxi. (i) හලාවත මුන්නේශ්වරම් භද්‍රකාලි අම්මන් කෝවිලෙහි අභ්‍යන්තර ස්වරූපය

(ii) පේච්චිඅම්මන් දේවී

(iii) ශ්‍රී දුර්ග

(iv) කාලි

(v) ශ්‍රී බහිරව

xxxii. හලාවත මුන්නේශ්වරම් භද්‍රකාලි අම්මන් කෝවිලේ බිලිපූජා

xxxiii. බිලි පූජා තහනම

xxxiv. ත්‍රිකුණාමලය ශ්‍රී භද්‍රකාලි අම්මන් කෝවිලෙහි ඉතිහාසය හා බැඳි තඹ බඳුන පිළිබඳ පුවත දැක්වෙන මූර්තිය

xxxv. ත්‍රිකුණාමලය ශ්‍රී භද්‍රකාලි අම්මන් කෝවිලෙහි කාලි දෙවඟනගේ මුල මූර්තිය

xxxvi. ත්‍රීකුණාමලය ශ්‍රී භද්‍රකාලි අම්මන් කෝවිලෙහි ගර්භගෘහයේ දොරටුව දෙපස පිහිටි මහා ලක්ෂ්මි හා මහා සරස්වතියගේ විමාන

xxxvii. ත්‍රීකුණාමලය ශ්‍රී භද්‍රකාලි අම්මන් කෝවිලෙහි බිත්ති මත සිතුවම්කර ඇති කාලියගේ විවිධ ස්වරූප නිරූපිත සිතුවම් (i-iii)

xxxviii. කාලි දෙවඟන හා බැඳි පුවත් නිරූපිත සිතුවම් (i-v)

xxxix. කාලිය දරුවකු දෙපළු කිරීමේ සිද්ධිය නිරූපිත මූර්ති

xl. පුරුෂ පාර්ශවය අංග ප්‍රදාංචනය පැවැත්වීම.

xli. පොංගල් පූජා, ළදරුවන් සඳහා වූ බාර ඉෂ්ට කිරීම

xlii. මෝදර කාලි කෝවිල

xliii. මෝදර කාලි කෝවිලේ කාලි දෙවඟනගේ මූලමූර්තිය

xliv. මෝදර කාලි කෝවිලේ නවරාත්‍රි උත්සවය

xlv. බදුල්ල රොක්හිල් කාලි කෝවිලෙහි කාලි දෙවඟනගේ මූලමූර්තිය

xlvi. බදුල්ල රොක්හිල් කාලි කෝවිලෙහි අභ්‍යන්තර ස්වරූපය (i-iv)
(මහාවිෂ්ණු, ශ්‍රීදේවි, පුමාදේවි, ශ්‍රී මාරිඅම්මන්, ශ්‍රී කාලි අම්මන්, සන්ඩේස්වරී)

xlvii. බදුල්ල රොක්හිල් කාලි කෝවිලෙහි පූජා චාරිත්‍ර

xlviii. මාතලේ ඒලුමුග කාලි අම්මන් කෝවිලෙහි සත්මුහුණු කාලි මූලමූර්තිය

xlix. මාතලේ ඒලුමුග කාලි අම්මන් කෝවිලෙහි සත්මුහුණු කාලි උත්සව මූර්තිය

l. රත්නපුර ශ්‍රී භද්‍රකාලි කෝවිලෙහි ශිවකාලි මූල මූර්තිය

li. රත්නපුර ශ්‍රී භද්‍රකාලි කෝවිලෙහි අභ්‍යන්තර ස්වරූපය

lii. රත්නපුර ශ්‍රී භද්‍රකාලි කෝවිල් බිමෙහි පිහිටි විහාරස්ථානය

liii. කාලි දෙවඟන උදෙසා පැවැත්වෙන අභිෂේක පූජා - ඖෂධීය ශාක පත්‍ර යුෂ, සඳුන් මිශ්‍ර ජලය, එළකිරි, කහ පළතුරු යුෂ, තැඹිළි (i-vi)

liv. මල් පූජා

lv. දෙහි ලෙලි පහන දල්වීම.

lvi. පහන් පූජා - ආර්ති කිරීම,

lvii. කොහොඹපත්‍ර පූජා

lviii. තේරු උත්සවය

lix. සයිවර් පූජා

lx. දෙහිමාල පූජා

lxi. අග්නි පූජා

lxii. පොල් ගැසීම

lxiii. පුහුල් කැපීම

lxiv. තේර් රථ

lxv. පාල් කුඩ පූජා

lxvi. ශරීරයෙහි උල්කටු ගසා පෙරහැරෙහි ගමන් කිරීම

lxvii. ගිණිසැලියේ පූජා

lxviii. ආඩිපුරම් උත්සවය

lxix. නවරාත්‍රී උත්සවය

lxx. කාසි කැපීම

lxxi. කෝලම් මඩුවේ මහ පන්දම

lxxii. කාලි වෙස් මුහුණ

lxxiii. භික්ෂූන් වහන්සේලා කාලි කෝවිලේහි පූජා පැවැත්වීම.

lxxiv. මහනුවර පත්තිනි දේවාලයෙහි පිහිටි කාලි දේවාලය

lxxv. පිල්ලෑව කාලි මෑණි දේවාලය

lxxvi. සිංහල කපුමහත්වරුන් සහ මෑණිවරුන් පවත්වාගෙන යනු ලබන කාලි දේවාලය

- i. මහා භද්‍රකාලි දේවාලය - පිල්ලෑව
- ii. සොහොන් කාලි දේවාලය - කපුලියද්ද
- iii. ශ්‍රී මහා කාලි දේවාලය - සීදුව
- iv. සොහොන් කාලි දේවාලය -හලාවත
- v. භද්‍රකාලි දේවාලය - වෙරළුපේ
- vi. භද්‍රකාලි දේවාලය - ගැටලෑව

vii. සොහොන් කාලි දේවාලය - කුරුණෑගල

viii. කාලි දේවාලය - උපුල්දෙණිය

ix. ශ්‍රී මහා භද්‍රකාලි දේවාලය - කතරගම

x. භද්‍රකාලි දේවාලය - නිකවුවැව

xi. ශ්‍රී කාලි දේවාලය - බොරලැස්ගමුව

lxxvii. මහාකාලි ධ්‍යාන යන්ත්‍රය

lxxviii. ආමර් වීදිය මහා කාලි අම්මන් තිරුක්කෝවිල්හි අභ්‍යන්තර බෝධිවෘක්ෂයේ බැඳ ඇති කුඩා තොටිලි

lxxix. නුවරඑළිය දඹගොල්ල වතුයායේ කාලි කෝවිලේ තේර් පෙරහැර

lxxx. වතුකර කාලි කෝවිල්

i. ශ්‍රී කාලිඅම්මන් කෝවිල - හාවාඑළිය

ii. කාලිඅම්මන් කෝවිල - සමර්සෙට් වතුයාය

iii. කාලි කෝවිල - දඹගොල්ල වතුයාය

iv. කාලි අම්මන් කෝවිල - රාක්ෂාව

v. සොහොන් කාලි කෝවිල - ගොන්දෙන්නාව

lxxxi. කාලි මෑණියන්ගේ වරමින් ආවේශ වීම.

lxxxii. ත්‍රිකුණාමලය ශ්‍රී භද්‍රකාලි අම්මන් කෝවිලෙහි ක්ෂේත්‍ර අධ්‍යයනයෙහි නිරත පර්යේෂකයා.

# උපකාරානුස්මෘති

පශ්චාද් උපාධි පීඨයේ පූර්ව සහ වත්මන් පීඨාධිපතිවරුන්ට, භාෂා සංස්කෘතික අධ්‍යයන සහ ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ පූර්ව සහ වත්මන් අංශාධිපතිවරුන්, මානව ශාස්ත්‍ර මණ්ඩලයේ පූර්ව සහ වත්මන් සභාපතිවරුන් මෙන්ම මානව ශාස්ත්‍ර මණ්ඩලය පළමුව සිහිපත් කරන්නේ ඔවුන්ගේ අවසරයෙන් තොරව මෙම පර්යේෂණය සිදුකළ නොහැකි බැවිනි.

පර්යේෂණය ආරම්භ කළ දිනයේ පටන් නිමවන තුරු නිසි මඟ පෙන්වා දුන් ආචාර්ය ඩබ්. බී. ඒ. විතාරණ ඇදුරුතුමන් සිහිපත් කරන්නේ හදපිරි භක්ත්‍යාදරයෙනි.

පර්යේෂණ කාර්යයේ නියැලීමේ වැදගත්කම පෙන්වා දෙමින් නිරතුරු මට ආශිර්වාද කරන මහාචාර්ය සමන්චන්ද්‍ර රණසිංහ ඇදුරුතුමන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝරි මනම්පේරි ඇදුරුතුමිය, ආචාර්ය හිමාලිකා රණවීර ඇදුරුතුමිය ඇතුළු පර්යේෂණ කාර්යයේ දී මාහට උපකාර කළ සියලුම ගුරුභවතුන් සහ භාෂා සංස්කෘතික අධ්‍යයන සහ ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයටත් තුති පුද කරමි.

පුස්තකාල පරිශීලනයේ දී මා හට සහය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ මහජන පුස්තකාලය, ජාතික පුස්තකාලය, කොළඹ කෞතුකාගාර පුස්තකාලය, ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාලය යන පුස්තකාලයන්හි පුස්තකාලාධිපතිවරුන් ඇතුළු කාර්යය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

ක්ෂේත්‍ර අධ්‍යයනයන්හි දී මාහට දත්ත ලබා දුන් සියලු දත්තදායකයන්ට මාගේ ස්තුතිය පුද කරමි. ඔබ මා වෙත ලබා දුන් දැනුම, විස්තර පර්යේෂණ නිබන්ධයේ පිටු අතර ගොනු වී ඇත. එහෙයින් ඔබ හට මාගේ ප්‍රණාමය පුද කරමි. ක්ෂේත්‍ර චාරිකාවන්හි දී මා හට නිරතුරු සහය වූ ශිෂ්‍ය පිරිස සිහිපත් කරන්නේ ඉතාමත් දයාබරත්වයෙනි.

නිබන්ධය පරිගණක යතුරුලියනය කර දුන් සාමා සොයුරිය සහ ජනිත් සොයුරාට ද මාගේ ස්තුතිය පුද කරමි. මාගේ ජීවිත ගමනට නිරතුරු ආශිර්වාද කරන ආදරණීය අම්මා, තාත්තා සහ සොයුරු සොයුරියන් ද ආදරයෙන් සිහිපත් කරමි. පර්යේෂණ කාර්යයේ දී මා හට නන් අයුරින් උපකාර කළ සියලු දෙනාට තුති පුදමි.

කේ. බී. දීපාල් ගුණසේන

# ශ්‍රී ලාංකේය සංස්කෘතියේ විද්‍යමාන කාලි සංකල්පය

කළු බණ්ඩාරගේ දීපාල් ගුණසේන

## සංක්ෂිප්තය

නිමේෂයෙන් නිමේෂය විශ්වයේ නව සොයාගැනීම් සිදු වෙයි. නව පැතිකඩක් ඔස්සේ නවීන තාක්ෂණික ලොව වෙත පියමං කිරීමට මානවයා සැමවිට ප්‍රයත්න දරයි. ලෝකය විද්‍යාත්මක සහ තාක්ෂණික වශයෙන් කෙතරම් දියුණු වූව ද මිනිසා සැම විට ම දේව විශ්වාස සමග බැඳීසිටියි. දේවත්වය මනුෂ්‍ය චිත්ත සන්තානගත, චිත්තවේගමය සංකල්පයකි. එය මිනිසාගේ සර්වකාලීන අවශ්‍යතාවකි. ලාංකේය සංස්කෘතියේ විද්‍යමාන දේව සංකල්ප රාශියකි. ඒ අතර කාලි සංකල්පය ද වෙයි. කාලි හින්දු දහමේ පුද ලබන දෙවඟනකි. ලාංකේය සංස්කෘතියෙහි ද්‍රවිඩ සහ සිංහල යන ප්‍රධාන ජන වර්ග දෙකට ම පොදු දේව සංකල්පයක් ලෙස කාලි සංකල්පය සුවිශේෂ වෙයි. කාලිය පිදීම ලාංකේය හින්දු ජනයා අතර පැතිර පවතින්නේ හින්දු දහමේ මහේශ්වරයා වන ශිව දෙවිඳුන්ගේ ප්‍රියාවගේ අධිබලැති ශක්ති ස්වරූපයක් ලෙසිනි. සිංහල බෞද්ධයන් අතර වත්මනෙහි ඉතා ම ජනප්‍රිය දෙවඟනක වන කාලිය අයුක්තිය පරයා යුක්තිය ජය ගැනීමට පිහිට වන දෙවඟනක ලෙස ද සිංහල ජන සමාජයෙහි වඩාත් ප්‍රකට ය. ලාංකේය සංස්කෘතියෙහි ප්‍රධාන ජනවර්ග දෙකකට අයත් පුද්ගලයන් විසින් වන්දනය කරනු ලබන දේව සංකල්පය ලෙස කාලි සංකල්පය අද්‍යතන ලාංකේය සංස්කෘතියෙහි ක්‍රියාත්මක ජනප්‍රිය දේව සංකල්පයකි.

ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් දේව සංකල්පයක් ලෙස පුරාණෝක්තිගත විශ්වාස හා බැඳීපවතින කාලි පිදීම විවිධ අවධීන්හි ලක්දිවට බලපෑ භාරතීය සංස්කෘතික බලපෑම් මත ලාංකේය සංස්කෘතියෙහි ව්‍යාප්ත විය. කාලි සංකල්පය ලාංකේය සමාජගත වීම සහ එහි ලාංකේය සංස්කෘතික ව්‍යාප්තිය අනාවරණය කරගැනීම මෙම පර්යේෂණයෙහි ප්‍රමුඛ අරමුණකි. එකී අරමුණ වෙත එළඹීම සඳහා ගුණාත්මක අධ්‍යයන ක්‍රමවේදය යටතේ දත්ත රැස්කිරීමේ දී ලේඛන හැදෑරීම, ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණය යොදාගනු ලැබිණි. දත්ත විශ්ලේෂණය විස්තරාත්මක ක්‍රමවේදය යටතේ කර ඇත.

කාලි සංකල්පය හා බැඳි කාලි පිදීම ද්‍රවිඩ හින්දු ජනයා සහ සිංහල බෞද්ධ ජනයා අතර අතීතයේ සිට පැවත ආ ආකාරය සහ එහි අද්‍යතන ස්වභාවය දත්ත විශ්ලේෂණයේ දී

අනාවරණය කරගත හැකි විය. කාලිය ද්‍රවිඩ හින්දු ජන සමාජයේ වන්දනයට පාත්‍ර වන්නේ ශිව දෙවිඳුන්ගේ ප්‍රියාව වන පාර්වතියගේ අධිබලැති ශක්ති ස්වරූපය ලෙසිනි. කාලිය සිංහල බෞද්ධ ජන සමාජයේ ප්‍රචලිත ව ඇත්තේ රෞද්‍ර ගුණයෙන් යුතු දෙවඟනක සේ ම 'කාලි අම්මා', 'කාලි මෑණියෝ' නමිනි. මවක සිය දරුවනට පිහිට වන්නා සේ කාලි මෑණියන් සැම විට ම සිය බැතිමතුනට පිහිට වන බව ජනවිඥානගත විශ්වාසයකි. කාලිය සිංහල ගැමි ආගම සමග සම්බන්ධ වීමේ දී මුළුමනින් ම බෞද්ධකරණය වී දේශීයත්වයට ආරෝපණය කරගත් අවස්ථා අනාවරණය කරගත හැකි විය.

කාලියගේ භෞතික ස්වරූපය භීෂණකාරී ස්වභාවයක් ගනී. එය දේවාත්මයකට වඩා යක්ෂාත්මයකට සමීප ය. එහෙත් හින්දු දහමේ දී කිසි ම අවස්ථාවක කාලිය යක්ෂණියක ලෙස නො සැලකේ. ඕ සැම විට ම රෞද්‍ර ගුණයෙන් යුතු මහ බලැති දෙවඟනකි. සිංහල ජන සමාජයෙහි කාලිය දෙවඟනක සේ ම යක්ෂණියක ලෙස ද පුද ලබන අවස්ථා වෙයි. කනදරා කෝරළය, දූදුරුඔයබඩ සහ ගාඩි ජන සමාජයේත් කාලිය යක්ෂණියක ලෙස ද පුදනු ලැබේ.

දේශීය යාතුකර්ම පද්ධතියේ දී මෙන් ම කලා නිර්මාණ අංගයන්හි දී ද එනම් ගී පබැඳුම්, ටෙලිනාට්‍ය සහ සිනමාවේ ද කාලි සංකල්පය නිරූපිත අවස්ථා මෙම අධ්‍යයනයේ දී අනාවරණය කරගත හැකි විය. කාලි සංකල්පය හා බැඳි මනෝවිද්‍යාත්මක පසුබිම මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වූ තවත් ක්ෂේත්‍රයකි.

අද්‍යතනයේ දී ද්‍රවිඩ හින්දු ජන සමාජයට වඩා සිංහල බෞද්ධ ජන සමාජයේ ජනප්‍රිය දේව වන්දනය කාලි දෙවඟන පිදීම බවට පත් ව ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය. බෞද්ධයන් බුදු දහමින් ඉටු නො වන අනේකවිධ ලෞකික අපේක්ෂා ඉෂ්ට සිද්ධ කරගැනීමට විවිධ දේව විශ්වාසයන්හි පිහිට පතමින් දේව වන්දනාවන්හි නිරත වීම අද්‍යතන සමාජයේ ඉතා ජනප්‍රිය අංගයකි. යහපතින් හෝ අයහපතින් සිය අපේක්ෂා කෙසේ හෝ මුදුන් පමුණුවාගැනීමට උත්සුක වන අද්‍යතන සමාජයේ, යුදකාමී ප්‍රභවයකට උරුමකම් කියන කාලි දෙවඟන පිදීම ප්‍රමුඛස්ථානයට පත් ව තිබේ.

ලක්දිව පුද ලබන අනෙකුත් හින්දු දේව සංකල්ප සියල්ල අබිබවා කාලි සංකල්පය ලාංකේය සංස්කෘතියේ ප්‍රබලත්වයට පත් ව ඇති බව පෙනේ.